සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

RICHMOND COLLEGE LIBRARY * GALLE *

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## බුද්ධ ධර්මය

නම/විභාග අංකය :- ..................................................................................... කාලය : පැය 02 යි.

සැලකිය යුතුයි:
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

### I කොටස

1. බුදුරජාණන් වහන්සේ පස්වන සතිය ගතකළ ස්ථානය නම්,
   1. මිදෙල්ල ගස මුල   2. අජපාල නුගරුක මුල
   3. කිරිපලු නුගරුක මුල   4. ජය ශ්‍රී මහා බෝධි මූලයෙහිය

2. බුදුන් දහම් සරණ ගිය ප්‍රථම දේවාචික උපාසකවරු වන්නේ,
   1. නදී හා ගයා කාශ්‍යප ය   2. කෝලිත හා උපතිස්ස ය
   3. තපස්සු හා භල්ලුක ය   4. ආලාර කාලාම හා උද්දකරාමපුත්ත ය

3. විමල, සුබාහු, පුණ්ණජි, ගවම්පති යන සතර දෙනා,
   1. යසකුල පුතුගේ මිතුරන් ය   2. නදී කාශ්‍යපගේ මිතුරන් ය
   3. උරුවෙල් කාශ්‍යපගේ මිතුරන් ය   4. ගයා කාශ්‍යපගේ මිතුරන් ය

4. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනාකරන ලද්දේ,
   1. බුද්ධත්වයෙන් වසර දෙකකට පසුය   2. බුද්ධත්වයෙන් වසරකට පසුය
   3. බුද්ධත්වයෙන් සිව් වසරකට පසුය   4. බුද්ධත්වයෙන් මාස තුනකට පසුය

5. බුදුරජාණන් වහන්සේ සතුවූ දමනය කළ නොහැකි සියල්ලන් දමනය කිරීමේ හැකියාව ධර්මයේ දක්වෙන්නේ,
   1. විජ්ජාචරණ සම්පන්න ගුණය ලෙසය   2. අනුත්තරෝ පුරිසදම්ම සාරථී ගුණය ලෙසය
   3. සම්මා සම්බුද්ධ ගුණය ලෙසය   4. ලෝකවිදූ ගුණය ලෙසය

6. තුන් සූත්‍රයට අයත් සූත්‍ර දේශනාවන් වන්නේ,
   1. මහා මංගල සූත්‍රය, සිගාලෝවාද සූත්‍රය, රතන සූත්‍රය   2. රතන සූත්‍රය, කරණීයමෙත්ත සූත්‍රය, අණන සූත්‍රය
   3. මහා මංගල සූත්‍රය, රතන සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය   4. මහා මංගල සූත්‍රය, රතන සූත්‍රය, දම්සක් පැවතුම් සූත්‍රය

420

7. කරණීය මෙත්ත සූත්‍රයේ මෙත් වැඩිය යුතු සියලු සතුන් අතර, 'ථාවරා' යනුවෙන් සඳහන් සතුන් වන්නේ,
   1. තැති නොගන්නා සත්ත්වයෝ ය   2. තැති ගන්නා සුළු සත්ත්වයෝ ය
   3. ඇසට පෙනෙන සත්ත්වයෝ ය   4. ඇසට නොපෙනෙන සත්ත්වයෝ ය

8. බුදු සසුනේ අග්‍ර දායකයා හා දායිකාව බවට පත්වූයේ,
   1. කොසොල් රජතුමා හා බන්දුල මල්ලිකාව ය   2. කොසොල් රජතුමා හා කෝසල මල්ලිකාව ය
   3. අනේපිඬු සිටුතුමා හා විශාඛාව ය   4. පූර්ණවර්ධන සිටුතුමා හා විශාඛාව ය

9. ආනන්ද හිමිගේ මග පෙන්වීම අනුව ආනන්ද බෝධිය රෝපණය කර ඇත්තේ,
1. ජේතවනාරාමයේ ය  2. වාලුකාරාමයේ ය  3. නිග්‍රෝධාරාමයේ ය  4. අශෝකාරාමයේ ය

10. බුදු දහම පටිසෝතගාමී ධර්මයක් වේ. එහි තේරුම වන්නේ බුදු දහම,
1. උඩුගං බලා යාමට මග පෙන්වන දහමක් බව ය  2. යටිගං බලා යාමට මග පෙන්වන දහමක් බව ය
3. ඉදිරියට බලා යාමට මග පෙන්වන දහමක් බව ය  4. දකුණත බලා යාමට මග පෙන්වන දහමක් බව ය

11. නිත්‍ය ශීලය, ගෘහස්ථ ශීලය යන නම් වලින් හැඳින්වෙන්නේ,
1. පංච ශීලයයි  2. දස සීලයයි  3. අෂ්ටාංග ශීලයයි  4. කෝටියක් සංවර ශීලයයි

12. පංච ශීලයෙහි ඇති ආජීව අෂ්ටමක ශීලයට අයත් නොවන සිල් පදය වන්නේ,
1. පිසුනාවාචා වේරමණී සික්ඛාපදං සමාධියාමි
2. ඵරුසාවාචා වේරමණී සික්ඛාපදං සමාධියාමි
3. සම්ඵප්පලාපා වේරමණී සික්ඛාපදං සමාධියාමි
4. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාධියාමි

13. මිච්ඡා ආජීවය යනුවෙන් ධර්මයෙහි සඳහන් වන්නේ,
1. නිවැරදි දිවි පැවැත්මයි  2. හිස් වචන කතා කිරීමයි  3. රළු වචන කතා කිරීමයි  4. වැරදි දිවි පැවැත්මයි

14. සිගාලෝවාද සූත්‍රයට අනුව අපට ආරක්ෂාවරණය සැලසීම,
1. ගුරුවරුන්ගෙන් ඉටුවන යුතුකමකි  2. දෙමාපියන්ගෙන් ඉටුවන යුතුකමකි
3. මිතුරන්ගෙන් ඉටුවන යුතුකමකි  4. වැඩිහිටියන්ගෙන් ඉටුවන යුතුකමකි

15. අපණ්ණක ජාතකයෙහි අනුවණ සාත්තු නායකයා වශයෙන් ඉපිද බුද්ධ කාලයේ දී විනාශ මුඛයට පැමිණියේ,
1. ඡන්න හිමියන්ය  2. දෙව්දත් හිමියන්ය  3. වක්කලී හිමියන්ය  4. සුභද්‍ර හිමියන්ය

16. සාලිකේදාර ජාතකයෙන් විස්තර වන්නේ,
1. අන්ධ දෙමාපියන්ට සැලකූ පුතෙකුගේ තොරතුරු වේ.  2. අන්ධ ස්වාමියාට සැලකූ බිරිඳකගේ තොරතුරු වේ.
3. දෙමාපියන්ට සැලකූ කුරුළු පැටවකුගේ තොරතුරු වේ.  4. වැඩිහිටියන්ට සැලකූ දරුවෙකුගේ තොරතුරු වේ.

17. කුඹුරුවලින් ලබාගන්නා අස්වැන්නේ පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීම හැඳින්වෙන්නේ,
1. සාංඝික දානය නමිනි  2. පේරු දානය නමිනි  3. අග්‍ර ශස්‍ය දානය නමිනි  4. දේව දානය නමිනි

18. සිගාලෝවාද සූත්‍රයේ ගුරුවරුන් උපමා කර ඇති දිශාව වන්නේ,
1. උතුරු දිසාවය  2. බටහිර දිසාවය  3. දකුණු දිසාවය  4. උඩ දිසාවය

19. සිරිත් මල්දම නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
1. ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම්තුමා විසිනි  2. තොටගමුවේ රාහුල හිමිපාණන් විසිනි
3. විදාගම මෛත්‍රීය හිමියන් විසිනි  4. පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා විසිනි

20. පත්ත කම්ම සූත්‍රයේ පංච බලි තුළින් පෙන්වා දෙන්නේ,
1. උපයන ධනය තමාගේ යහපතට පමණක් යොදවාගත යුතු බවය
2. උපයන ධනය පවුලේ යහපතට පමණක් යොදවාගත යුතු බවය
3. උපයන ධනය මතු ප්‍රයෝජනය සඳහා රැකගත යුතු බවය
4. උපයන ධනය සමාජ යහපතට හේතුවන අයුරින් යොදවාගත යුතු බවය

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

1. i. බුදු රජාණන් වහන්සේ සත්වන සතිය ගතකළ ස්ථානය නම් කරන්න.
   ii. ලෝකයාට දහම් දෙසන ලෙස බුදු රජාණන් වහන්සේට ආරාධනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
   iii. තෙරුවන් සරණ ගිය පළමු උපාසිකාවන් දෙදෙනා නම් කරන්න.
   iv. බුදු රජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ තිරිසන් සතෙකු නම් කරන්න.
   v. තුන් පිටකය අතරින් ධම්ම පදය අයත්වන පිටකය කුමක්ද? (ලකුණු 4 x 5 = 20)

2. i. බුදු රජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ අසරණයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)
   ii. උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග 3 ක් ලියන්න. (ලකුණු 3)
   iii. ඔබ අසරණයෙකුට හෝ ගිලන් වූ පවුලේ කෙනෙකුට පිහිට වූ අවස්ථාවක් විස්තර කරන්න. (ලකුණු 5)

3. i. වෛරය සන්සිඳෙන අයුරු කියැවෙන ඔබේ පෙළපොතේ ඇතුලත් ධම්ම පද ගාථාව ලියන්න. (ලකුණු 2)
   ii. එම ධම්ම පද ගාථාවේ තේරුම ලියන්න. (ලකුණු 3)
   iii. මෛත්‍රී සහගතව කටයුතු කිරීමෙන් ඔබට සැළසෙන යහපත විස්තර කරන්න. (ලකුණු 5)

4. i. බොරු කීමෙන් වැළකීමේ ශික්ෂා පදය පාලියෙන් ලියන්න. (ලකුණු 2)
   ii. පංච ශීලයෙහි සමාදාන පක්ෂයට අයත් කරුණු තුන ලියන්න. (ලකුණු 3)
   iii. පන්සිල් රැකීමෙන් සමාජයට වන යහපත විස්තර කරන්න. (ලකුණු 5)

5. i. අඥාන වෙළඳ නායකයකු හා ඥානවන්ත වෙළඳ නායකයකු පිළිබඳ කියැවෙන ජාතක කතාවේ නම කුමක්ද? (ලකුණු 2)
   ii. එම කතා පුවත ඇසුරින් යහපත් නායකත්ව ගුණාංග 3 ක් ලියන්න. (ලකුණු 3)
   iii. ඥානවන්න වෙළඳ නායකයා බුද්ධිමත්ව ක්‍රියා කිරීමෙන් තම අරමුණු ජයගත් ආකාරය විස්තර කරන්න. (ලකුණු 5)

6. i. විදේශීය වශයෙන් ඇති වූ ආක්‍රමණවලදී ඒවාට විසඳුම් සෙවීමට නායකත්වය ගෙන ක්‍රියා කළ භික්ෂූන් වහන්සේලා දෙනමකගේ නම් ලියන්න. (ලකුණු 2)
   ii. භික්ෂූන් වහන්සේලාගෙන් සමාජයට සිදුවන සේවාවන් 3 ක් ලියන්න. (ලකුණු 3)
   iii. කළගුණ සැලකීමේ අගය විස්තර වන වාක්‍ය 5 ක් ලියන්න. (ලකුණු 5)

7. පහත දක්වෙන මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   i. විශාඛා මහ උපාසිකාව
   ii. ඉවසීම
   iii. ධම්ම පදය
   iv. වැඩිහිටියන්ට සැලකීම

(එක් කොටසකට ලකුණු 5කි.)